සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව -සති පාසල

විෂය - මව්බස | 2021 අගෝස්තු 02 සිට අගෝස්තු 08 දක්වා සතිය | සතිය - 14

ශ්‍රේණිය :- 5 | සැකසුම :- ආර්.කේ.තරංගා මධවන්ති මිය ර/ඇඹි /කාවන්තිස්සපුර ම.වි. 5 ශ්‍රේණිය බාර

- **ආදරණීය දුවේ පුතේ,**
- **පහත ඒක වචන හා බහු වචන පද තේරුම් ගෙන කීප වරක් කියවන්න.**

ගස - ගස්
මල - මල්
ගල - ගල්
අම්මා - අම්මලා
තාත්තා - තාත්තලා
-
පොත - පොත්
කුඹුර - කුඹුර
ළමයා - ළමයි
ශිෂ්‍යයෝ - ශිෂ්‍යයෝ
මම - අපි

කුරුල්ලා - කුරුල්ලෝ
උදැල්ල - උදලු
ගොවියා - ගොවියෝ
බල්ලා - බල්ලෝ
ගවයා - ගවයෝ
පේළිය - පේළි
කණ්ඩායම - කණ්ඩායම්
ගුරුවරයා - ගුරුවරු
රට - රටවල්
ලේඛකයා -ලේඛකයෝ

- **පහත ඡේදය කිහිප වරක් කියවන්න**

කාලයක සිට බලාපොරොත්තු ව සිටි ගමනක් යෑමට පබෝධාට අවස්ථාව උදා විය. ඒ මුහුදු වෙරළට යෑමට ය. ඇය නියමිත දිනයේ සැමට පළමු ව අවදි ව ගමනට සූදානම් වූවා ය. "අම්මේ, මගේ එක සපත්තුවයි තියෙන්නේ. කෝ අනික් සපත්තුව" පබෝධාගේ අයියා ජනිත් සිය මවගෙන් විමසුවේ ය. "පුතා සපත්තු තියෙන්නේ ඉස්සරහ රාක්කයේ නේ. අනික් සපත්තුවත් එතන ඇති. ගිහින් බලන්න" අම්මා පිළිතුරු දුන්නා ය. "අම්මේ, අපිත් එක්ක කුමාරි නැන්දායි මනීෂා අක්කායි යනවා නේ ද ?" "ඔව් දුවේ, මට දැන් මතක් වුණේ. මම හදපු කඩදාසි මල් ටික මේසය උඩ ඇති. ඒකෙන් රතුපාට මල් පොකුරයි කහපාට මල් පොකුරු තුනයි පරිස්සමින් අරගන්න. ඒක මතක් කරල කුමාරි නැන්දට දෙන්න" අම්මා කිවුවා ය. මෙතෙක් නිහඬ ව සිටි තාත්තාගේ කටහඬ අවදි විය. "පුතා . . . ඔයාගේ කාමරය ඇතුළේ පොත් පාර්සලයක් ඇති. ඒ පොත් පාර්සලය මනීෂා අක්කාට දෙන්න ඕනෑ; ඒක ගන්න. අනික් කාමර දෙකෙන් එකක මගේ කණ්ණාඩි කුට්ටමත් ඇති; ඒකත් අරගෙන ම එන්න" තාත්තා අයියාට පැවසුවේ ය. "අම්මේ . . . එන්න. අපි මිදුලේ ඉන්නේ" යැයි මම පැවසුවෙමි. "මම කාමරයේ දොරයි, ඉස්සරහ දොරවල් දෙකයි වහගෙන ම එන්නම්. පුතාලා වාහනයට නඟින්න."අම්මා පැවසුවා ය. අතරමඟ දී කුමාරි නැන්දා සහ මනීෂා අක්කා ද ගමනට එකතු වූහ. සියල්ලන් ම මුහුදු වෙරළට යන විට සවස හතර පමණ විය. "අද නංගිට හරි ම සතුටු යි. කවදා ඉඳන් ද එන්න සූදානම. මටත් හරියට ඕනෑකම තිබුණා, දුව එක්ක ගෙන එන්න." අම්මා මනීෂා අක්කාට කිවුවා ය. "අන්න අයියේ ලොකු නැවක්. අර බලන්න. අර බලන්න" පබෝධා උඩ පනිමින් කෑගැසුවා ය. "ඔව් නංගි. එතන තියෙන්නේ එක නැව යි. අර බලන්න. අර ඈත නැව් දෙකක් ම එනවා." ජනිත් අයියා පබෝධාට නැව් දෙකක් පෙන්වී ය.

- ඡේදයේ ඇතුළත් ඒකවචන නාම පද සහ බහුවචන නාම පද වෙන වෙනම ලියන්න

| ඒක වචන පද | බහුවචන පද |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |